අපි ආයේ දවසක හමුවෙමුද
මේ අද වගේ
දැන් ඉර ගිලෙයි මුහුදේ
කළුවර පිපෙයි දෙපසේ
වෙන්වෙමු ඉතින්
හමුවෙන සිතින්
අපි ආයෙ දවසක අද වගේ

අදින් පසු ඔබ ඔබට හිමි මග
ඉතින් මම මට උරුම තනි මග
ආයෙමත් හමුවෙන තුරා
දෙතැන ඉමු අපි මග බලා

තුටින් හමුවුණ සුහද බව අප






සිසිර දිසානායක

# ආයේ දවසක

පසුගියදා මෙල්බර්න් නුවර දී ''සරස වසන්තය'' ප්‍රසංගය වේදිකා ගතවුණා. එයට සම්බන්ධ වුණ ශිල්පී ශිල්පිනියන් අතරින් ගායනා ක්ෂේත්‍රයට නවකයා වුණ දයාන් විතාරණ ගායන ශිල්පියා මුණ ගැසෙන්නට අපට අවස්ථාව ලැබුණා. දයාන් වෘත්තියෙන් ඡායාරූප ශිල්පියෙක්. ඔහු මුලින්ම නමක් දිනා ගත්තේ ඒ අංශයෙන්. තමන්ට ම ආවේනික ආරකට තමන්ටම ආවේනික ගැඹුරු තීව්‍ර හඬකින් ගායනා කරන දයාන් සංගීතයට මුල පිරුවේ නන්දා මාලනියගේ සංගීත ආශ්‍රමයෙන්. ඒ කාලයේ ම තමයි විශාරද දීපිකා ප්‍රියදර්ශනියත් නන්දා මාලනියගෙන් ශිල්ප හැදෑරුවේ.

දයාන්ගේ ජනප්‍රිය ගීත කීපයකම පද රචකයා වුණ රවී සිරිවර්ධනත් ඒ වෙලාවේ දයාන් එක්ක හිටපු එක අපේ කාරියට තවත් ආලෝකයක් වුණා. ''ඔබෙ සුසුම් පවන්'', ''වසත් කාලය මනරම්'' වගේ අගේ ඇති ගීත කීපයක් ම දයාන්ට ලියා දුන්න රවී විද්‍යාර්ථියෙකුව ඉන්න කාලයේ පටන්ම කවි, ගීත ලියන්න හපන්කම් දක්වපු රචකයෙක්. දීපිකා ප්‍රියදර්ශනියගේ ''මල් වරුසා'' ගීත එකතුවට නවකයින් හත්දෙනෙක් සින්දු ලිව්වා. ඒ අය අතරින් ඒ කාරිය දිගටම කරගෙන යන්නෙ තුන්දෙනෙක් විතරයි. එයින් එක්කෙනෙක් රවී. අනික් රචකයා ආනන්ද හේවා රංහිඳගේ. අනික් රචකයා ගැන ලියන්න ඕන නෑනේ?

රවී තමන් දයාන්ට ලියා දුන්න ''අපි ආයේ දවසක'' ගීතය ගැන මේ විදියට කතාව පටන් ගත්තා.

''මේ ගීතයට මට මූලික අත්දැකීම වුණේ දයාන් අයියම තමයි. මම සමහර වෙලාවට අයියාගෙන් විමසලා තියෙනවා විවාහය ගැන....'' දයාන් තවමත් අවිවාහකයි. ''මම විතරක් නෙවෙයි පත්තරවලින් පවා ඒ ගැන අහපුවම දයාන් අයියා කියලා තියෙන්නෙ මම විවාහ වෙන්න බලාපොරොත්තු වෙන්නෙ නෑ'' කියලයි. අනික අම්මත් එක්ක තිබුණ බැඳීමත් මම දැකලා තිබුණා. මට ඉතින් ඉන්න ගමන් හිතුණා අපි කවුරුත් එක්ක මේ විදියට හිතවත් වෙලා ඉන්න නම් ගායන ශිල්පියා ආයෙමත් ගෙදරට ගියාට පස්සේ තනිවෙනවා නේද කියලා. ඒ වගේ හැඟීමක් තමයි මූලික අත්දැකීම වුණේ. ඒ අත්දැකීම වර්ධනය වීමක් හැටියට තමයි ගීතය තවදුරටත් නිර්මාණය වෙන්නෙ.

පස්සේ දවසක මම දයාන් අයියාගේ ගෙදර ගිය වෙලාවක මම අයියට කිව්වා ලස්සන සින්දුවක් ආවා අයියේ කියලා. ''මල්ලි ඕක මගේ මේ පොතේ ම ලියන්න'' කියලා පොතක් දුන්නා. ඒ පොතේ අන්තිම කොලේ මම ඉතින් වචන ටික ලියලා ආවා. කොහොමත් සමුගෙන යන මොහොතක් ගැන කියවෙන ගීතයක අවශ්‍යතාවයත් දයාන් අයියාට තිබුණා. කිසියම් සුහද අවස්ථාවක් ගත කරලා වෙන් වෙලා යනකොට සමහර සින්දු තියෙනවා හරියට දැනෙන. දැන් කිව්වොතින් අමරදේව මහත්තයාගේ ''මළ හිරු බසිනා හැන්දෑ යාමේ'' වගේ සින්දුවක් වෙන්වීමකදී හරියට දැනෙන සින්දුවක්නෙ. දෙවෙනි සී.ඩී. එකයි, ඒ වෙනුවෙන් කරපු ප්‍රසංගයයි දෙකම අවසන් කළෙත් ඔය සින්දුවෙන් ම තමයි. බොහොම හැඟීම් බර නික්මයාමත් මූර්තිමත් කරන සින්දුවක් වුණා මේ ගීතය.

''මම පුද්ගලිකව හරිම තෘප්තිමත් ගීතයක් මේ ගීතය. ''දයාන් කතාවට එක්වුණා. දැන් අපි ජීවිතයේ නොයෙක් වෙලාවලදී විවිධ පුද්ගලයින් හමුවෙනවානෙ. ''අපි ආයේ දවසක හමුවෙමු මේ අද වගේ'' කියන එකයි මම හරි ආසා කරන දේ. ඒ අය අද වගේ හොඳ හිතින් ආයෙත් හමුවෙනවා නම් කොයිතරම් හොඳද?

''මේ තියෙන සුහදකම අපි අරගෙන ගෙදර යනවා. අපේ මතකයේ ඒ සුහදකම තිබිලා ආයෙත් අද වගේම හමුවෙන්න ඕන කියන අදහස තමයි ලියවුණේ.'' රවී දයාන්ට හවුල් වුණා.

''මේ වචන ටික දැක්කම හරි ආසා හිතුණා. කොහොමත් කොලේක ලිව්වොත් ඕක එහෙ මෙහෙ වෙන්න පුළුවන් නිසයි මම රවි මල්ලිට පොතක්ම දුන්නෙ. මේ පොත පෙරලාගෙන ඉන්න කොට මට ම තනුවක් ආවා. ඉතින් මම ඒක කැසට් එකකට රෙකොඩ් කරලා මහින්ද අයියට දුන්නා. මහින්ද අයියාත් හරි ක්ෂණිකව සංගීතය පිළියෙල කරලා දුන්නා. ගොඩාක් ගිටාර්වලින් තමයි සංගීතය කෙරුණෙ. ගායනා කරන කොට ගොඩක් දුකක් ඇති වුණා. පද වැලේ තියෙන වෙන්වීම සුහද වෙන්වීමක් වුණාත් ඒ දුක ඇති වෙන්න හේතුවක් තියෙනවා. කොච්චර කිව්වත් අපි අද වගේ ආය හමුවෙන්නෙ නෑ. ආය හමුවෙන කොට අපි දවසකින් හරි වියපත් වෙලා. අපිට මේ මොහොත කොහොමටවත් රඳවා ගන්න බෑ. සංගීත තැටිය එළිදක්වපු දා ඒ නිවේදකයා කිව්වා අපි ලබන අවුරුද්දේදී තවත් සංගීත තැටියකින් මුණ ගැහේවි කියලා. දැනට අවුරුදු තුනක් ගතවෙලත් ඒ දේ වුණේ නෑ. ඒ වගේ තමා හැම දෙයක්ම. මේ අනිත්‍ය ලෝකයේ වෙන දේවල් ගැන අපි කොහොමද කියන්නෙ?

දයාන් කතාව නතර කළේ ශෝකාකූල ස්වරයකින්. ඇත්තටම ඒ තනුවේත් මහින්ද බණ්ඩාර සංගීතවේදියාගේ සංගීතයේත් ඒ ශෝකාකූල බව තවත් හොඳට ගැබ්වෙලා තියෙනවා කියලය අපට හිතෙන්නෙ. ''සන්නස'' පාඨකයින් වෙනුවෙන් දයාන්ටත්, රවීටත් ස්තූතිවන්ත වෙන්න අප අමතක කළේ නෑ. සම්බන්ධීකරණය කළ කළිඳු වීරසිංහ සොයුරාවත් අප අමතක කරන්නේ නෑ.

---

## ලොව විශිෂ්ඨම පෙම්වතුන් දෙදෙනාගේ විවාහය



අවංක ආදරයටත් කරන්න බැරි පෙරළියක් නැති තරම්. ඒ බව වඩාත් තහවුරු කළ අපූරු ආදර කථාවක් පසුගියදා ආජන්ටිනාවෙන් අහන්න ලැබුණා.

මේ ආදර කතාවේ කථා නායකයා රෙනාල්ඩෝ වැවෙචේ. එතකොට කථා නායිකාව ඇඩෙල්ෆා වොල්පස්. පිරිමියෙකුටයි ගැහැණියෙකුටයි කසාද බඳින්න තහනමක් තියෙනවාද? නමුත් මේ දෙන්නගේ විවාහය නම් අහන හැමෝටම තරමක් ඇස් විශාල කරවන විමතිය දනවන පුවතක් වුණා.

ඒකට හේතුව වෙලා තිබුණේ මනමාලයා මනමාලියට වඩා වසර 58 ක් බාලවීමයි. ඒ කියන්නේ මනමාලයාගේ වයස අවුරුදු 24 යි. මනමාලියට වයස අවුරුදු 82 යි. ඔවුන්ගේ විවාහය පසුගියදා උතුරු ආජන්ටිනාවේ ශාන්ත ජේ දේවස්ථානයේදී සිදු කෙරුණා.

මගේ මිතුරන්ට එහෙමත් නැත්නම් වෙන කාට හරි අපේ විවාහය ගැන ඕනම දෙයක් කියන්න පුළුවන්. ඒත් මම ඔවුන්ගේ අදහස් එතරම් සැලකිල්ලට ගන්නේ නැහැ. ඇත්තෙන්ම මම බොහෝ කලක සිටම මුහුකුරා ගිය කාන්තාවන්ට තද ඇල්මක් දැක්වූවා'' ඔවුන්ගේ විවාහය වාර්තා කරන්න පැමිණ සිටි මාධ්‍යවේදීන්ට රෙනාල්ඩෝ එහෙම ප්‍රකාශ කළා.

විවාහයෙන් පස්සේ මධුසමය ගත කිරීම සඳහා මේ නව යුවල ආජන්ටිනාවේ අගනුවර වන රියෝද ජැනරෝයි බලා පිටත්ව යාමට තීරණය කර තිබුණා.

ඔබේ විවාහය සිදුවුණේ අවංක ආදරය නිසාමදැයි කිහිපදෙනෙකු ඇඩෙල්ෆා ගෙන් විමසනු ලැබුවා. ඒ මොහොත් මහ හඬින් සිනාසුනු ඇය '' ඇයි නැත්තේ ඉදිරි කාලයේදී තවත් පුදුම දේ අහන්නට ලැබේවි'' යයි පවසා තිබුණා.

කොහොම නමුත් ඔවුන් අතර සිදුවූ මෙම විවාහයට මඟ පෑදී තිබුණේ 15 හැවිරිදි වියේ පසුවෙද්දී රෙනාල්ඩෝ ගේ මව මිය යෑමත් සමගය. එතැන් සිට මේ දක්වා ගෙවී ගිය අවුරුදු 9 ක කාලය තුළ ඔහු ජීවත් වී ඇත්තේ ඇඩෙල්ෆාගේ රැකවරණ සහිතවය.

රෙනාල්ඩෝටත් ඇඩෙල්ෆාටත් සුභ මංගලම් යයි ආශීර්වාද කළ යුතුය.

## තත්පර 38 කදී අලෙවි වූ "ස්පයිස් ගර්ල්ස්" ලා

කාලයක් ලෝකය පුරාම ජනාදරයට පත්ව සිටි සංගීත කණ්ඩායමක් ලෙස ''ස්පයිස් ගර්ල්ස්'' හඳුන්වන්න පුළුවන්.



ඒ ජනප්‍රිය සංගීත කණ්ඩායම නිර්මාණය වී තිබුණේ තරුණියන් 5 දෙනෙකු ගෙන් වීම විශේෂත්වයක්. ඔවුන්ගේ ගීත සංයුක්ත තැටි මිලියන 50 කට වැඩි ප්‍රමාණයකින් ලොවපුරා අලෙවි වී තිබුණා.

එහෙත් 1998 මැයි මාසයේදී ගෙරි හේලිවල් නැමති සාමාජිකාව ''ස-''පයිස් ගර්ල්ස්'' කණ්ඩායම හැර ගියා. ඉන්අනතුරුව එංගලන්ත පාපන්දු කණ්ඩායමේ නායකත්වය දැරූ ඩේවිඩ් බෙකම් හා විවාහ වී සිටි වික්ටෝරියා බෙකම්, එමා බන්ටන්, මෙලනි බ්‍රවුන් හා මෙලන් චිසෝල් ද අලුත් නිර්මාණ කිරීම අතහැර දමා තිබුණා.

කාලයාගේ ඇවෑමෙන් මේ පස්දෙනා යළිත් ඔවුන් නතර කල තැන සිට යළිත් ''ස්පයිස් ගර්ල්ස්'' සංගීත කණ්ඩායමට පණ දෙන්න තීරණය කරනු ලැබුවා.

ඒ අනුව ඔවුන් එහි පළමු පියවර වශයෙන් ලබන දෙසැම්බර් 15 වැනිදා ලන්ඩන් නගරයේදී සිය සංදර්ශනය පැවැත්වීමට සැලසුම් කළා. එම සංදර්ශණය සඳහා මුද්‍රණය කරණ ලද ප්‍රවේශ පත්‍ර සියල්ලක්ම ගිනි ජාලයකට හසුවූ පුළුන් පිඩක් සේ විකිණී අවසන් වුණා.

ඇත්තෙන්ම ඒ සඳහා ගතවී තිබුණේ තත්පර 38 ක් තරම් පුංචි කාලයක් විතරයි. පුදුම හිතුනත් ''ස්පයිස් ගර්ල්ස්'' කණ්ඩායමේ ජනප්‍රියත්වයට ඒක හොඳ මිනුම් දණ්ඩක්.

ඒ විතරක් නෙවි. ඒ සංදර්ශණය බලන්න ටිකට් ගන්න බැරිවුණ ප්‍රමාණයෙන් අති විශාල පිරිසක්. ඒ නිසා සංවිධායකයින්ට සිදුවී තිබුණා ලන්ඩන් නගරයේදී තවත් සංදර්ශණ තුනක්ම සංවිධානය කරන්න. ඒ අනුව ලබන දෙසැම්බර් 16, 18 හා ජනවාරි 2 වැනිදාත් ''ස්පයිස් ගර්ල්ස්'' සංදර්ශණය ලන්ඩන් නගරයේදී පැවැත්වේවි.

ඉතින් ඊට පස්සේ ඒ අය ඇමරිකාවට ගිහිල්ලා සැන්ජෝස්, ලොස් ඇන්ජලීස්, ලාස්වෙගාන්, නිව්යෝර්ක් යන නගරවලත් ස්පාඤ්ඤයට ගිහිල්ලා කොලොන්ග්, මැඩ්රිඩ් නගරවලත්, චීනයට ගිහිල්ලා ෂැන්හායි, බීජිං නගරවලත්, හොංකොං හීත්, ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයේ හා දකුණු අප්‍රිකාවේ කේප් ටවුන් නගරයෙත් සංගීත සංදර්ශණ පවත්වන්න සැලසුම් කර තියෙනවා.

ඔවුන්ගේ මේ චාරිකාව අවසන් වන්නේ බුවනෝස්අයර්ස් නගරයෙන් ලු.

සීවලි එදිරිවීර